# කණිට්ඨතිස්ස මහරජුගේ පදවිය බොරළුකන්ද ගිරිලිපිය

## ගල්වැවේ විමලඛන්ති හිමි

### හැඳින්වීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අංක 14 බෝගහවැවතුලාන බොරළුකන්ද ග්‍රාමසේවක වසමේ පිහිටි නිකසල ආරණ්‍ය සේනාසනයේ ස්ථාපිතව ඇති අප්‍රකාශිත කණිට්ඨතිස්ස මහරජුගේ රාජ්‍ය කාලයට අයත් ගිරි ලිපිය කියවා ප්‍රකාශයට පත් කිරීම මෙහි අරමුණ යි. මෙම ශිලාලිපිය මීට පෙර කිසිවෙකු විසින් ප්‍රකාශයට පත් කර නොමැති අතර එය පැරණි දාගැබක් ඉදිරියේ ඇති කුඩා ගල් තලාවක සිරස් ආකාරයෙන් එම ගල් තලාව සම්පූර්ණයෙන් ම වාගේ ආවරණය වන ආකාරයෙන් සටහන් කොට තිබේ. තත් ස්තූපයට කරන ලද පරිත්‍යාගයන් පිළිබඳ විස්තර මේ ශිලාලේඛනයේ අන්තර්ගතව පවතී. මෙම ශිලාලිපිය පිළිබඳව මා දැනුවත් කරන ලද්දේ කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා (විශේෂ) දෙවන වසරේ ඉගෙනුම ලබන ශකිල රාජකරුණා නම් ශිෂ්‍යයා විසිනි. ඔහුට මේ පිළිබඳව දැනුම්දී ඇත්තේ බොරළුකන්ද ග්‍රාමසේවක වසමේ පදිංචි එස්.එන්.ඩී.කසුන් මහේෂාන් නම් ශිෂ්‍යයා විසිනි. මේ ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලීමේදී තහවුරු වූයේ මෙම ශිලාලිපිය සැලකියයුතු ප්‍රමාණයකින් සුරක්ෂිතව පවතින බව යි. තව ද මේ ශිලාලිපියට මඳක් ඔබ්බෙන් ඇති තිරස් ගල් තලාවේ තවත් ශිලාලේඛනයක් වෙයි. එය බෙහෙවින්ම ගෙවී ගොස් තිබේ. එහෙත් වචන කිහිපයක් කියවා ගත හැකි ය. මේ ශිලාලේඛන කියවීමෙන් තත් විහාරස්ථානයට රාජ්‍යානුග්‍රහය නොමදව ලද බව තහවුරු වන අතර වංසකථාවේ ප්‍රකට රජවරුන් මේ ස්ථානයේ දියුණුව වෙනුවෙන් කටයුතු කර තිබෙන ආකාරය පැහැදිලි වේ.

ශිලාලිපිය විහාර සංකීර්ණයේ දකුණු පසට වෙන්නට සටහන් කොට ඇති අතර එය දිගින් අඩි දහතුනක් (13) තරම් විශාල පරාශයක සටහන් කොට තිබේ. පළලින් අඩි (06) ක් තරම් ප්‍රමාණයක එය සටහන් කොට ඇත. ලිපියේ පේළි හය (06) කි. අකුරක් අඟල් 08

සිට අඟල් 03ක් තරම් ප්‍රමාණයක් දිගින් යුක්ත ය. පළලින් අඟල් 06 ක් තරම් විශාල ප්‍රමාණයේ සිට අඟල් එක හමාරක් (1 1/2) තරම් කුඩා වූ ද විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්තව සටහන් කොට තිබේ. ශිලාලේඛනය සටහන් කළ ගල්වඩුවාට එය නිවැරදි ලෙස ඉඩ පරාශය තුළ සටහන් කිරීම පිළිබඳ දැනුමක් නොතිබි බව පැහැදිලි වේ. තව ද අක්ෂර පිළිබඳව අවබෝධයක් ද නොතිබුණ බව පැහැදිලි වන අතර පේළි හා පේළි අතර පරතරයක් තබා ගැනීම පිළිබඳව ද පැහැදිලි අවබෝධයකින් තොරව ම ලිපිය සටහන් කොට තිබේ. මේ නිසා ඇතැම් වදන්වල සමහර අක්ෂර අඩුවීමට ද එය බලපා ඇති බව ලිපිය සියුම්ව පරීක්ෂා කිරීමේදී සනාථ වේ. කෙසේ වෙතත් රාජ නියමයෙන් විහාරස්ථානයට පරිත්‍යාග කරන ලද වැව් හා කුඹුරු පිළිබඳ පැහැදිලි විස්තරයක් මේ ශිලාලේඛනය තුළ අන්තර්ගතව පවතී. එය කියවා ගැනීමේ දී ගෙවී ගොස් ඇති බැවින් වදන් නිවැරදි ලෙස කියවා ගැනීමට ඇති අපහසුව මෙන් ම ගල්වඩුවාගේ නොදැනුවත් භාවය නිසා මගහැරුණු ඇතැම් අක්ෂර ද අධ්‍යාහාරයෙන් ගැනීමට සිදුව තිබේ. කෙසේ වෙතත් සියුම් පරීක්ෂාවකින් අනතුරුව ලිපියේ සමස්ත අර්ථය වටහා ගැනීමට මේ පර්යේෂණයෙන් අවකාශ හිමි විය.

මෙහි ''සිද්ධම'' යන ආශීර්වාදාත්මක වදන ඉතා විශාල ලෙස සටහන් කොට තිබේ. මේ නිසාම ලිපියේ ඊළඟ පේළි අතර සම්බන්ධතාවක් අවබෝධ කර ගැනීමට අපහසු වන ආකාරයෙන් සෙසු වගන්ති සටහන් කිරීමට සිදුව තිබේ. කෙසේ වෙතත් අවසානයේ දී තමාට ලබාදෙන ලද සියලු වගන්ති තිබෙන ඉඩ පරාශය තුළ සටහන් කිරීමට ගල්වඩුවා ක්‍රියා කොට ඇත.

**පෙළ**

01 සිද්ධම මළිමහරජහ පුත අබයෙ නිබනිඑකවිහරහි

02 බනකරහි රිචියෙ දෙබරහි වවි දිනෙ. යහිරකිය කළඩිහපතියහ චිය කු

03 බරි කරිහි බෙයෙහි නවියහිය කුබර කරිහිය... කුබර කරිහි... කළටඩ කබහිටිය කුබර ක

04 රිහිය කෙත කුබර දොකරහ කුබර (කරිහි) බගය කියගවප කුබර කරිහි

05 ...වක කුබර කරිහි කරඩලහ කුබර කරිහි වය කුබර කරිහිච (අ)ට කුබුර කරිහි

06 ...බහ කුබුර කරිහි කඩබක කුබර ක(රි)යහිච්ය තුබ දිනිහි.

අර්ථය

යහපතක් වේවා කණිට්ඨතිස්ස මහරජුගේ පුත් අභය නිබ්බාන ඒක විහාරයෙහි දහම් මඩුවේ (ධර්මශාලාව) යහපත සිදුකරනු කැමැත්තේ දෙබරහි වැව පරිත්‍යාග කරන ලද්දේ ය. යහිරකියෙහි වසන කළඩිග නම් ගමේ බද්ද ද චිය කුඹුරෙන් කරීසයක් ද බෙයෙහි නවියගේ කුඹුරෙන් කරීෂයක් ද ......නම් ස්ථානයේ ඇති කුඹුරෙන් කරීෂයක් ද කලටඩ කබහිටිය නම් කුඹුරෙන් කරීෂයක් ද කෙත කුඹුර හා දොකරහ කුඹුරෙන් කරීෂයක් ද බගයගේ කියගපව කුඹුරෙන් කරීෂයක් ද ........වක නම් කුඹුරෙන් කරීෂයක් ද කරඩලගේ කුඹුරෙන් කරීෂයක් ද වය කුඹුරෙන් කරීෂයක් ද අට නම් කුඹුරෙන් කරීෂයක් ද ....බහ නම් කුඹුරෙන් කරීෂයක් ද කඩබක නම් කුඹුරෙන් කරීෂයක් ද යන මේ සියල්ල ස්තූපය සඳහා දෙන ලදි.

විමර්ශන

මෙම ශිලාලිපිය කරවා ඇත්තේ මළිමහරජුගේ පුත් අභය නම් කුමාරයෙක් විසිනි. මෙහි අවධානයට පාත්‍ර විය යුතු වදන් දෙකක් තිබේ. ඉන් එකක් වන්නේ මළිමහරජ යන්න යි. ශිලාලේඛනයෙහි එම වදන් සැකයකින් තොරව කියවා ගත හැකි ය. මළිමහරජ වශයෙන් මීට පෙර මහරජකෙනෙක් වංසකථාවලින් හෝ ශිලාලේඛනවලින් හමුවී නොමැත්තේ ය. එහෙත් මළිතිස නම් මහරජ කෙනෙක් පිළිබඳව ශිලාලේඛනවලින් හමුවී ඇත. මෙම කරුණ පැහැදිලි කර ගැනීමට සමත් තවත් ශිලාලිපියක් මේ ආරාම සංකීර්ණයේ ම පවතී. එය බෙහෙවින් කැඩී ගොසිනි. එහෙත් එහි ඇති වදන් කිහිපයක් මෙහිදී වැදගත් වේ. එම ශිලා ලිපිය මෙසේ ය.

පෙළ

01 ... ය කරවය ...

02 ... මහ බිකුසගහ ....

03 ... ක මහරජහ පුත (ම)ළිතිස ... හ ...

04 ... බිකුස(ග) ...අ... (ව)විය ...

05 ... විහරි දිනි.

**අර්ථය**

... කරවන ලද්දේ ය. ... මහ භික්ෂු සංඝයාට ... (නක හෝ සිරිනක නම්) මහරජුගේ පුත් මළිතිස හෙවත් කණිට්ඨතිස්ස ... හ ... ..භික්ෂු සංඝයාට ... අ ... නම් වැවේ ... (යම් බද්දක්) ... විහාරයට දෙන ලදි.

මෙම ශිලාලිපියේ ඇති ... ක මහරජහ පුත (ම)ළිතිස යන වදන බෙහෙවින් වැදගත් වේ. එය කැඩී ඉතිරිව ඇති කොටසේ 'ක' යන්නෙන් අවසන් වන, වෙනත් ශිලාලේඛනවල දැක්වූ රජ කෙනෙකුට අයත් වේ. තවද ඒ මහරජුගේ පුත් මළිතිස වශයෙන් රජවූ රජු බව ද මේ ශිලාලේඛනයෙන් පැහැදිලි වේ. මෙය උක්ත පළමුවන ශිලාලේඛනයේ දැක්වෙන මළිමහරජු කවුරුන්දැ යි වටහා ගැනීමට මහත් සේ උපකාරී වේ.

**මළිමහරජ**

දැනට ප්‍රකාශයට පත් කොට ඇති ශිලාලේඛනවල මළිතිස හෝ මලි තිස වශයෙන් දැක්වූ කණිට්ඨතිස්ස මහරජුට අයත් ශිලාලේඛන කිහිපයක් දිස් වේ. ඒ අතර මින්විල ගිරි ලිපියේ දැක්වෙන්නේ නකමහරජහ පුත බතියතිස රජහ මළි තිස මහරජ නම් රජ කෙනෙකි **(Paranavitana S. 2001.133)** මෙහි ප්‍රකාශවන ආකාරයට නක මහරජුගේ පුත් වූ භාතියතිස්ස මහරජුගේ මළණුවන් වූ තිස්ස නම් රජ කෙනෙකි. එම රජු මහාවංසයේ හඳුන්වා ඇත්තේ කණිට්ඨතිස්ස යන නාමයෙනි **(හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි හා බටුවත්තුඩාව (2012. 156)**. කණිට්ඨ තිස්සට (ක්‍රි.ව.164-192) පෙර රජකම් කරන ලද්දේ භාතික තිස්ස (ක්‍රි.ව.140-164) නම් රජ කෙනෙකි **(හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි හා බටුවත්තුඩාව (2012. 156)**. ඔහු මහල්ලක නාග (ක්‍රි.ව.134-140) රජුගේ වැඩිමහල් පුත්‍රයා ය **(හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි හා බටුවත්තුඩාව (2012. 156)**. මහල්ලක නාග රජ වූයේ

පරම්පරාවේ නියමාකාර ක්‍රමයෙන් නොවේ. ඔහු ගජබා රජුගේ ඤාති සොහොයුරෙකි. (හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි හා බටුවත්තුඩාව (2012. 156). මහාවංස විස්තරයෙන් පෙනෙන්නේ මහල්ලක නාග ගජබා රජුගේ (ක්‍රි.ව.112-134) බිසවගේ පියා බව ය **(හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි හා බටුවත්තුඩාව (2012. 156).** කෙසේ වෙතත් පාළි භාෂාවේ භාවිත වචනවලට අනුව මහල්ලක යනු මහලු **(හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි හා බටුවත්තුඩාව (2012. 155).** යන අර්ථය ද භාතික යනු සොහොයුරු **(බුද්ධදත්ත හිමි, 1998. 386)** යන අර්ථය ද කණිට්ඨ කණිෂ්ඨ හෙවත් බාල, කණිටු **(බුද්ධදත්ත හිමි, 1998. 389)** යන අර්ථය ද ඇති වචන වේ. ඒ අනුව මහල්ලක නාග රජුගේ පුත්‍රයන් දෙදෙනාම තිස්ස යන නමින් අමතා තිබේ. මහල්ලක නාග රජු නාග යන ප්‍රකට නාමයෙන් අමතා තිබේ. ශිලාලේඛනවල එන බතිය යනු සොහොයුරු යන අර්ථයත්, මළි යනු මල්ලී යන අර්ථයත් ප්‍රකාශයට පත් වේ. එනයින් බැලූ කළ මේ රජවරු තිදෙනාට ම භාවිත නාමයන් වනුයේ නාග හා තිස්ස යන නම් පමණි. කෙසේ වෙතත් මෙම ශිලා ලිපියේ යෙදී ඇති මළි මහරජහ යනු එවිට මළණු මහරජ වශයෙන් අර්ථ කියවිය යුත්තේ ය. එහෙත් එබඳු රජ කෙනෙක් ශ්‍රී ලංකා රාජ්‍ය නාමාවලියෙහි නොදැක්වෙන අතර එම වදන භාවිත කරන ලද්දේ කණිට්ඨතිස්ස මහරජතුමාට බව අනෙකුත් එම රජුගේ ප්‍රකාශිත ශිලාලේඛන විමර්ශනය කිරීමෙන් පෙනී යයි. ශිලාලිපිය කෙටුම්පත් කළ කෙනාට හෝ ගල් වඩුවාට සිදුවූ අත්වැරදීමක් නිසා තිස යන වදන සටහන් නොවූ බව සිතිය හැකි ය. එහෙත් වරද නිවැරදි කරමින් එම අක්ෂර ආසන්නයේ උඩින් හෝ යටින් තිස යන්න සටහන් කිරීමක් ද මෙහිදී සිදු කළ බවක් නොපෙනේ.

**දීපවංසයේ** මෙම රජවරුන් තිදෙනා පිළිබඳව දැක්වෙන තොරතුරු ද බොහෝ සෙයින් **මහාවංසයේ** පෙනෙන තොරතුරුවලට සමානකමක් ගනී. එහි දැක්වෙන ආකාරයට මහල්ලක නාග හා එම රජුගේ පුතුන් දෙදෙනා වන භාතික තිස්ස හා කණිට්ඨතිස්ස ක්‍රමයෙන් රාජ්‍යපදප්‍රාප්තියට පත්වූ බව සටහන් වේ **(බුද්ධදත්ත හිමි, 1998. 386).** මේ නිසා රාජ්‍යපදප්‍රාප්තිය පිළිබඳ වංසකථාවන්හි පෙනෙන විස්තරයන්හි දෝෂ සහගත බවක් නොපෙනේ.

ශිලාලිපියේ සඳහන් ''මළි'' මහරජු හඳුනා ගැනීම සඳහා පුරාක්ෂරවිද්‍යාත්මක සාක්ෂි ද මෙහිදී පරිහරණය කළ හැකි ය. මළිතිස මහරජ වශයෙන් හඳුනාගත් ශිලාලේඛන හයක් (06) මේ වන විට ප්‍රකාශයට පත්ව තිබේ. ඒ අතුරින් පොළොන්නරුව මීන්විල හයවැනි (06) ශිලාලේඛනයෙහි රජු හඳුන්වා ඇත්තේ නක මහරජහ පුත බතිය තිසරජහ මළිතිස මහරජ වශයෙනි **(කිරිඇල්ලේ ඥානවිමල, 1959, 106).** සෝමාවතී පුවරු ලිපියෙහි රජු හඳුන්වා ඇත්තේ නක මහරජහ පුත බතියතිස මහරජහ මළිතිස මහරජ වශයෙනි **(Paranavitana S. 2001.133)**. අනුරාධපුර ඔච්චප්පුකල්ලු ශිලාලේඛනයෙහි රජු හඳුන්වන්නේ නක මහරජහ පුත මළිතිස මහරජ වශයෙන් සිය වැඩිමහල් සොහොයුරාගේ නාමය සඳහන් කිරීමෙන් තොරව ය (**Paranavitana S. 2001.135**). අනුරාධපුර අභයගිරි ආළින්ද පුවරු ලිපියෙහි රජු හඳුන්වා ඇත්තේ නක මහරජහ පුත මළිතිස මහරජහ යන වදන් වලිනි (**Paranavitana S. 2001.143**). මෙයින් ඇතැම් ශිලාලේඛනවල රජු සිය සොහොයුරා වූ බතියතිස මහරජු පිළිබඳව ද සඳහන් කරන අතර ඇතැම් ශිලාලිපිවල සිය පියා වූ නක මහරජු පිළිබඳව පමණක් සඳහන් කර ඇත. ඒ හැරුණු විට තම්මැන්නාව දෙවන (02) ගිරි ලිපියෙහි මළිතිස මහරජහ චත ලගිත (**Paranavitana S. 2001.152**) වශයෙන් යෙදී තිබේ. අභයගිරියේ බටහිර වාහල්කඩෙහි ඇති මළිතිස මහරජුගේ මවගේ භෂ්මාවශේෂ තැන්පතුවක් පිළිබඳව කියවෙන පුවරු දෙකක් තිබේ. ඒවාහි මළිතිස මහරජහ රජිනි මතබියෙ හා මත සොරලයෙ වශයෙන් යෙදී තිබේ (**Paranavitana S. 2001.140**). ඒවා රජු විසින් කරවූ ශිලාලේඛන නොවන අතර රජුගේ සම්බන්ධය ඉන් පෙන්වා දී තිබේ. අනුරාධපුර කෞතුකාගාරයේ තැන්පත් කොට ඇති කැඩී ගිය ශිලාලිපියක අවසන පුවිය මළිතිස මහරජහ වශයෙන් යෙදී තිබේ (**Paranavitana S. 2001.145**). නෙළුම්පත් පොකුණ ගිරිලිපියෙහි යෙදී ඇත්තේ නක මහරජහ පුත මළුතිස මහරජි වශයෙනි (**Paranavitana S. 2001.146**). එහි මළි වෙනුවට පැහැදිලිවම යෙදී ඇත්තේ මළු තිස යන වදන යි. අභයගිරි ආළින්ද ශිලාලේඛනයෙහි යෙදී ඇත්තේ නක මහරජහ පුත මළිතිස මහරජි වශයෙනි (**Paranavitana S. 2001.150**). මහල්ලිගෙ දමන ගිරි ලිපියෙහි එය යෙදී ඇත්තේ ...රජහ පුත මළිතිස මහරජි යන යෙදුමෙනි (**Paranavitana S. 2001.133**). මෙලෙස මෙතෙක්

ප්‍රකාශයට පත් කොට ඇති කණිට්ඨතිස්ස රජුගේයැ යි හඳුනාගත් ශිලාලේඛනවල රජු හඳුන්වා ඇති ආකාර කිහිපයක් නිරීක්ෂණය කළ හැකි ය. එහි දී රජු ම කරවූ ශිලාලේඛන ද රජුගේ කාලයේ කළ ශිලාලේඛන ද වෙයි. එහෙත් ඒ කිසිම ශිලාලේඛනයක රජු මළි මහරජ වශයෙන් හඳුන්වා දී නොමැත. එහෙත් මළි යන්න මූර්ධජ 'ළ' යන්නෙන් මේ සෑම ලිපියක ම රජුගේ නාමය සටහන් කොට ඇති අතර මෙම ශිලාලිපියේ ද පැහැදිලිවම මූර්ධජ ළ යන්න භාවිත කොට තිබේ. බොහෝවිට සිතිය හැක්කේ මෙම ලිපිය සටහන් කළ තැනැත්තාට තිස යන්න සටහන් කිරීමට අතපසුවීමක් සිදුවී ඇති බව යි. ලිපියේ අක්ෂර හා ශිලාලේඛන සටහන් කිරීමේ කලාව හා විස්තර ඉදිරිපත් කිරීමේ ආකාරය බෙහෙවින් ම උක්ත කණිට්ඨතිස්ස මහරජුගේ ශිලාලේඛනවල එන සඳහන් හා සමාන වේ. මේ නිසා මේ ලිපිය කණිට්ඨතිස්ස මහරජුගේ රාජ්‍ය කාලයට (ක්‍රි.ව.164-192) අයත් ලෙස නිගමනය කළ හැකිය.

පුතඅබයෙ

මෙම ශිලාලේඛනයට අනුව කණිට්ඨතිස්ස මහරජුගේ පුතා අභය (අබය) වශයෙන් හඳුන්වා දී ඇත. එහෙත් වංසකථාවන්හි රජුට අභය නමින් පුතෙක් සිටි බවට සාධක හමු නොවේ. මහාවංසයෙහි සඳහන් වන්නේ කණිට්ඨතිස්ස මහරජුට පුතුන් දෙදෙනෙක් සිටි බව පමණි. ඒ කුජ්ජනාග (ක්‍රි.ව.186-187) හා කුඤ්චනාග (ක්‍රි.ව.187-189) යන රජවරුන් දෙදෙනා ය **(හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි හා බටුවන්තුඩාව, 2012. 156).** එහෙත් මේ ශිලාලිපියේ සඳහන් වන ආකාරයට අභය නමින් කුමාරයෙක් සිටි බව වංසකථාවෙහි සඳහන් නොවේ. කෙසේ වෙතත් රජවූ කුමාරවරුන් හැර සෙසු කුමාරවරුන් පිළිබඳව වංසකථාවන්හි වැඩි විස්තර සඳහන් නොවන බැවින් අභය නමින් කුමරෙක් කණිට්ඨතිස්ස රජුට නොසිටියායැ යි තර්ක කළ හැකි නොවේ. මේ නිසා මේ ශිලාලේඛනයෙන් කණිට්ඨතිස්ස රජුට අභය නමින් තවත් රජ කුමරෙක් සිටි බවට සාධක හමු වේ. අනෙක මේ ශිලාලිපියේ සඳහන් ප්‍රදානයන් කරන්නේ ද අභය වන බැවින් ඔහු මේ ප්‍රදේශයේ ප්‍රාදේශීය පාලකයා වශයෙන් ද ක්‍රියාකරන්නට ඇති බව සිතිය හැකිය.

## නිබනි එක විහරහි

නිබනි එක විහර යනු තත් යුගයේ මෙම විහාරස්ථානයට භාවිත කළ නාමය යි. මෙහි ඇති 'ව' සහ 'එ' යන අක්ෂරයන්ගේ ස්වරූපයන් පුරාක්ෂරවිද්‍යාත්මකව විමර්ශනය කිරීමෙන් පසු මෙම විහාරයට නිබනි එක විහර වශයෙන් නම් කර ඇති බව මෙහි දී සටහන් කළෙමි. ව යන්න හා එ යන්න බොහෝ විට මේ යුගයේ සමාන රූපාකාරයෙන් යෙදුන තැන් බෙහෙවින් නිරීක්ෂණය කළ හැකිය. මේ ශිලාලිපියේ ම දෙවන හා තෙවන පේළිවල ද ව යන්න දිස් වේ. මේ නිසා එම ව යන්නෙන් එ කාරය වෙනස් වන බැවින් මේ සඳහා නිබනි එකවිහර යන වචනය ම ගත් බව සැලකුව මනා ය. මෙහි ඇති එ කාරය ව කාරය ලෙස ගතහොත් නිබනිවක විහාරය වශයෙන් එම විහාරය නම් කොට ඇති බව පෙනේ. එහෙත් පැහැදිලිව ම මෙහි එක විහර වශයෙන් නම් කොට තිබූ බව සඳහන් කළ හැකිය. නිබනි යනු නිබ්බාන යන පදය ඇති වදනකි. පාලි භාෂාවෙන් නිබ්බාන යනු නිවීමයි. බෞද්ධයන්ගේ පරම නිෂ්ඨාව නිවන යි. එක විහර යන්නේ නිවන් දෙන හෝ නිවන් ලැබිය හැකි එකම විහාරය වශයෙන් එය නම් කොට තිබූ බව පැහැදිලි වේ. විහාරයේ ඇති වටිනාකම වැඩිවීම සඳහා නිර්වාණාවබෝධයට ඇති එකම විහාරස්ථානය වශයෙන් යම් විහාරයක් නම් කිරීමේ හැකියාවක් තිබේ.

## බනකරහි

බනකර වශයෙන් යෙදෙන්නේ දම් සභා මණ්ඩපය යි. බොහෝ විහාරස්ථානවල තත් යුගයේදී ද බන කියන තැනක් තිබී ඇත. නූතනයේ ධර්මශාලාව වශයෙන් ගැනෙන්නේ මේ ගොඩනැගිල්ල යි. මේ සම්බන්ධයෙන් හෙවත් විහාරස්ථානයක අතීතයේ ධර්ම දේශනා පැවැත්වීම සඳහා ස්ථානයක් හෙවත් ගෘහයක් පැවති බව මහාවිහාරයේ ධම්මසංඝණි ගෘහය පිළිබඳ සඳහනෙන් පැහැදිලි වේ **(බුද්ධදත්ත හිමි. 1998. 270).** 'ධමමසංඝණි' යන නමින් ම කියවෙන පරිදි එය ධර්ම සංඝායනා පැවැත්වූ ස්ථානය බව පෙනේ. ඇතුළු නුවර දළදා මාළිගය හා මහපාලි දාන ශාලාව අසල පිහිටි ධම්මසංගණී ගෙය 'ධම්මධාතුඝර' හෙවත් 'ධම්මධාතු මන්දිරය' නමින් ද හඳුන්වා තිබේ. ඒ අනුව ධර්ම සජ්ඣායනා කිරීම පමණක් නොව ධර්ම ග්‍රන්ථ (ධර්ම

ධාතුව) තැන්පත් කර තිබීම ද එහි සිදුකර තිබේ. බනකර යනු ද ඊට ම භාවිත වචනයක් බව පැහැදිලි වේ. ''පබ්බතපාදෙ අනෙකසත පාසාද පරිවෙණ චංකමන රත්තිට්ඨාන, දිවාට්ඨාන, ධම්මසාලා ගෝපුර පාකාරාදි අවයව සහිතෙ විවිධෙ සංඝාරාමෙ කාරෙත්වා'' **(වික්‍රමග මගේ චන්ද්‍රා,1995, 47)** වශයෙන් හත්ථවනගල්ල විහාර වංසයෙහි ධර්මශාලා හෙවත් දම්සභා මණ්ඩපයන් ද වෙහෙරවිහාරයන්හි ඉදිකළ බව සඳහන් වේ. මේ අනුව බනකර යනු ධර්මය දේශනා කළ, ධර්මය සජ්ඣායනා කළ හා ධර්ම පුස්තක තැන්පත් කළ ස්ථානය හෙවත් ගෘහය වශයෙන් ගත හැකි බව පැහැදිලි වේ.

**දෙබරහි වවි**

දෙබර වැව මෙම විහාරස්ථානය සඳහා පූජා කළ බව මෙහි සඳහන් වේ. නූතනයේ දෙබර වැව යනු කුමන නමකින් කියවෙන්නක්දැ යි පැහැදිලි නොවේ. පුරාණ වැව් කිහිපයක් විහාරස්ථානය අවට පවතී.

**කරිහි, කිරිහි**

මෙම ශිලාලිපියෙහි මීළඟට වැදගත් වදන් වන්නේ කරීෂ පිළිබඳව එන සඳහන යි. මුදල් ඒකක හා ඉඩම් ඒකක පිළිබඳව ශිලාලේඛනවල බෙහෙවින් සඳහන් වන වචනයක් වශයෙන් කරීෂ යන්න හඳුන්වා දිය හැකිය. මෙහි කුඹුරුවලින් විහාරයේ දාගැබට කරීෂ දොළහක් (12) පරිත්‍යාග කොට තිබේ. නූතනයේ මැනුම් අනුව අක්කර වශයෙන් ගත් විට අක්ක්ර 192 ක් පරිත්‍යාග කොට තිබේ. රීස් ඩේවිඩ්ස් දක්වන ආකාරයට කරීෂයක් අමුණු හතරකට සමාන වේ (**Rhys Davids, T.W. 1996. 18**). අමුණකට අක්කර හතරක් අන්තර්ගත වේ (**Rhys Davids, T.W. 1996. 18**). කෙසේ වෙතත් මෙම ශිලාලිපියට අනුව අක්කර 192 ක කුඹුරු පරිත්‍යග කොට ඇත්තේ විහාරස්ථානයේ දාගැබට යි. මෙම ශිලාලිපිය ඇත්තේ ද එම දාගැබ ආසන්නයේ ම ය. එහෙත් උක්ත දෙබරහි වැව පරිත්‍යාග කොට ඇත්තේ බණකරය සඳහා ය. මේ අනුව මේ ශිලාලිපියෙන් දැක්වෙන ආකාරයට බනකරයට හා තිබ හෙවත් දාගැබ සඳහා කළ පරිත්‍යාගයන් තුනක් පිළිබඳ පැහැදිලි විස්තර මේ ශිලාලිපියේ අන්තර්ගතව තිබේ. ඒ වැව, කලඩිග නම්ගමෙන් ලද බදු ආදායම හා කුඹුරුවලින් ලැබුණු ආදායම යි. ලිපියේ අන්තර්ගත කුබර වශයෙන් යෙදුණු වචනයෙන් කියවෙන්නේ

කුඹුර යන අර්ථය යි. ඒ හැරුණු විට අනෙක් වචන තත් යුගයේ කුඹුරු තිබූ ප්‍රදේශ නාමයන් වශයෙන් හඳුනා ගත හැකිය.

**නිගමනය**

පදවිය නිකසල ආරණ්‍ය සේනාසනයේ පවත්නා කණිට්ඨතිස්ස මහරජුගේ රාජ්‍ය කාලයට අයත් ගිරි ලිපියෙන් එම රජුට අබය නමින් තවත් පුතෙක් සිටි බව සනාථ වේ. එහෙත් ඒ පුතු රාජ්‍යත්වයට පත් වූයේ නැත. එබැවින් එම කුමරු පිළිබඳව පළමුවෙන් කරුණු හෙළි වන්නේ මේ ශිලාලිපියෙනි. තව ද බනකරය හෙවත් දම්සභා මණ්ඩපය සඳහා කළ පරිත්‍යාගයක් පිළිබඳව ද සඳහන් වන්නේ මේ ශිලාලේඛනයෙන් වන බැවින් මේ ශිලාලිපියේ තොරතුරු තවත් වැදගත් වේ. ඒ හැරුණු විට ක්‍රි.ව. තෙවන සියවසේ භාෂා රටාවෙන් හා අක්ෂර රූප රටාවෙන් රචිත ශිලාලේඛනයක් වශයෙන් මේ ශිලාලේඛනය බෙහෙවින් වැදගත් බව හඳුන්වා දිය හැකි ය. මේ ආසන්නයේ ම ඇති අනෙක් බෙහෙවින් ගෙවී ගිය ශිලාලිපියෙන් ද මේ තොරතුරු ම සනාථ වන අතර මෙම ශිලාලිපියේ කරුණු විග්‍රහ කර ගැනීමට ද එය බෙහෙවින් උපකාරී වන බව සඳහන් කළ හැකිය.



පදවිය බොරළුකන්ද ගිරි ලිපිය - 01



**පදවිය බොරළුකන්ද ගිරි ලිපිය - 02**

## ආශ්‍රිත ග්‍රන්ථ


හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි හා බටුවන්තුඩාව, (2012). **මහාවංසය,** (පරි.) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධදත්ත හිමි පොල්වත්තේ, (1998). **පාලි සිංහල අකාරාදිය,** දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**දීපවංසය,** කිරිඇල්ලේ ඥානවිමල නාහිමි (සංස්.) (1959). කොළඹඃ කැම්.ඩී. ගුණසේන සහ සහෝදරයෝ.

වික්‍රමගමගේ චන්ද්‍රා, (1995). **අනුරාධපුර පූජනීය හා රාජකීය ස්ථාන,** දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

උතුරාවල ධම්මරතන හිමි, (සංස්.) (1989). **හත්ථවනගල්ල විහාර වංසය,** කොළඹඃ සමයවර්ධන.

Paranavitana S., (2011). **Inscriptions of Ceylon,** Vol. II, Part II, Archaeological Survey Department of Sri Lanka.

Rhys Davids, T.W., (1996). **On The Ancient Coins and Measures of Ceylon,** New Delhi: Asian Eduction Series